# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

10 ශ්‍රේණිය

## විද්‍යාව

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

## *I* කොටස

**ප්‍රශ්න සියල්ලටම දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.**

1) මෝටර් රථයක වේගය පැයට කිලෝමීටර් 40 කි. එය සම්මත ආකාරයට දක්වා ඇති පිළිතුර වන්නේ,
   (i) $40\ KM.P.H$ (iii) $40\ kmh^{-1}$
   (ii) $40\ km/\ H$ (iv) $40\ kmh$

2) පොස්පරස් සංඝටකයක් ලෙස පවතින ජෛව අණුව කුමක්ද?
   (i) න්‍යෂ්ටික අම්ල (iii) ලිපිඩ
   (ii) ප්‍රෝටීන (iv) කාබෝහයිඩ්‍රේට්

3) එක්තරා වස්තුවක චලිතයට අදාල විස්ථාපන කාල ප්‍රස්තාරය මෙහි දක්වා ඇත.




මෙයට අනුකූල වන ප්‍රවේග-කාල ප්‍රස්තාරය මින් කුමක්ද?

(i)



(ii)



(iii)



(iv)



4) මේවායින් සිලිකන් මූලද්‍රව්‍යය අඩංගු නොවන සංයෝගය කුමක්ද?
   (i) තිරුවානා (iii) මැටි
   (ii) ගල් අඟුරු (iv) වැලි

5) ගම්‍යතාවයෙහි ඒකකය කුමක්ද?
   (i) $gms^{-2}$ (iii) $kgms^{-1}$
   (ii) $kgms^{-2}$ (iv) $Nms^{-1}$

6) ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමෙන් පමණක් උච්චවායු වින්‍යාසය ලබා ගන්නා මූල ද්‍රව්‍යය කුමක්ද?
   (i) පොටෑසියම් (iii) ෆ්ලුවරින්
   (ii) හීලියම් (iv) ඇලුමිනියම්

7) සෛලීය ශ්වසනය සහ ප්‍රෝටීන් සංශ්ලේෂණය සිදු වන ඉන්ද්‍රියිකා පිලිවෙලින් දක්වා ඇති පිලිතුර තෝරන්න.

(i) රික්තකය, අන්තඃප්ලාස්මීය පාලිකා
(ii) රයිබසෝම, න්‍යෂ්ටිය
(iii) මයිටොකොන්ඩ්‍රියා, රයිබසෝම
(iv) න්‍යෂ්ටිය, ගොල්ගිදේහ

8) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් $10\ g$ හි අන්තර්ගත සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් අණු ගණන කොපමණද? $(Na - 23\ , O - 16\ ,\ )$

(i) $\frac{1}{10} \times 6.022 \times 10^{23}$
(ii) $\frac{1}{4} \times 6.022 \times 10^{23}$
(iii) $10 \times 6.022 \times 10^{23}$
(iv) $4 \times 6.022 \times 10^{23}$

9) ඛනිජ ලවණ පිළිබඳව අසත්‍ය වගන්තිය තෝරන්න.

(i) මිනිස් දේහ බරින් වැඩිම ඛනිජ වර්ග වන්නේ කැල්සියම් හා සල්ෆර් වේ
(ii) ඛනිජ ලවණ අකාබනික සංයෝග වේ
(iii) සින්ක් ඌනතාව ශාක පත්‍ර වල අසාමාන්‍ය ඝනකමක් ඇති කරයි
(iv) ගලගණ්ඩය යනු අයඩීන් ඌනතාව නිසා ඇතිවන රෝගයකි

10) පොළව මට්ටමේ සිට $40\ ms^{-1}$ ප්‍රවේගයෙන් සිරස්ව ඉහලට විසි කළ වස්තුවක් මුල් තත්පර 2 තුල දී ගමන් කරන උස කොපමණද?

(i) $60\ m$ (ii) $80\ m$ (iii) $40\ m$ (iv) $70\ m$

11) $x$ නම් උදාසීන පරමාණුවකට ශක්ති මට්ටම් 2 ක් පවතී. එහි න්‍යෂ්ටියෙහි ප්‍රෝටෝන 7ක් ද පවතී. ආවර්තිතා වගුවෙහි $x$ අයත් වන කාණ්ඩය කුමක්ද?

(i) $VIII$ කාණ්ඩය
(ii) $II$ කාණ්ඩය
(iii) $V$ කාණ්ඩය
(iv) $I$ කාණ්ඩය

12) පහත දක්වා ඇත්තේ එක්තරා අණුවක ව්‍යුහයකි. මෙහි $x$ හා $y$ සඳහා ගැලපෙන මූල ද්‍රව්‍ය පිළිවෙලින් දක්වන්න.

(i) $C, H$
(ii) $F, N$
(iii) $O, H$
(iv) $N, H$




13) සැහැල්ලු ඒකාකාර දණ්ඩක් රූපයේ පරිදි සමතුලිතව පැවතීමට යෙදිය යුතු $A$ වස්තුවෙහි ස්කන්ධය කොපමණද?

(i) $720\ g$
(ii) $240\ g$
(iii) $560\ g$
(iv) $120\ g$




14) අන්තර් අණුක ආකර්ශණ බල නිසා ජලය සතුවන ගුණාංගයක් නොවන්නේ මින් කුමක්ද?

(i) ජලයේ විශිෂ්ට තාප ධාරිතාව අඩුවීම
(ii) ජලයේ තාපාංකය වැඩි වීම
(iii) ජලයේ ඝනත්වය අයිස් වලට වඩා වැඩිවීම
(iv) කාමර උෂ්ණත්වයේදී ජලය ද්‍රව ලෙස පැවතීම

15) බල යුග්මයක් ක්‍රියාත්මක වන අවස්ථාව කුමක්ද?

(i) ස්පැනරයක මිට දිග වැඩි කිරීමට බටයක් යෙදීම
(ii) ඉස්කුරුප්පු නියන මගින් ඇණයක් තද කිරීමේදී
(iii) ජනේලයක් විවෘත කිරීමේදී
(iv) නිව්ටන් තුලාවකින් වස්තුවක බර මැනීමේදී

16) හූනා, පෙන්ගුවින්, ඩොල්ෆින්, පණුගෙම්බා යන ජීවීන් අයත් වන වර්ග පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(i) ඇම්ෆිබියා, මැමේලියා, පිස්කේස්, රෙප්ටීලියා
(ii) ඇම්ෆිබියා, ආවේස්, මැමේලියා, රෙප්ටීලියා
(iii) රෙප්ටීලියා, ආවේස්, මැමේලියා, ඇම්ෆිබියා
(iv) රෙප්ටීලියා, මැමේලියා, පිස්කේස්, ඇම්ෆිබියා

17) සංසේචිත ඩිම්බයක අඩංගු වර්ණදේහ ගණන කොපමණද?

(i) 23 (ii) 22 (iii) 43 (iv) 46

18) මෙම වස්තුව මත ක්‍රියාකරන සම්ප්‍රයුක්ත බලයෙහි විශාලත්වය කොපමණද?

(i) $50\,N$
(ii) $70\,N$
(iii) $30\,N$
(iv) $20\,N$




19) කැල්සියම් කාබනේට් $20\,g$ ස්කන්ධයක පවතින කැල්සියම් කාබනේට් මවුල ගණන කොපමණද? $(Ca - 40\,, C - 12, O - 16)$

(i) 2 (ii) 5 (iii) 0.2 (iv) 0.5

20) මෙම අයන බණ්ඩක අතුරින් ධන ආරෝපිත වන්නේ කුමක්ද?

(i) සල්ෆේට්
(ii) බයිකාබනේට්
(iii) ඇමෝනියම්
(iv) හයිඩ්‍රොක්සිල්

21) වස්තුවකට $20\,N$ බලයක් යෙදීම නිසා එහි $5\,ms^{-2}$ ක ත්වරණයක් හට ගනියි නම් එම වස්තුවේ ස්කන්ධය සොයන්න.

(i) $20\,kg$ (ii) $4\,kg$ (iii) $100\,kg$ (iv) $5\,kg$

22) $A$ ලෝහයේ නයිට්‍රේටයේ සූත්‍රය $A(NO_3)_3$ නම් $A$ හි ඔක්සයිඩයේ සූත්‍රය කුමක්ද?

(i) $AO$ (ii) $AO_3$ (iii) $A_2O_3$ (iv) $A_2O$

23) වර්ධක ප්‍රචාරණය සිදු කරන ශාක කොටස සහ උදාහරණය නිවැරදිව ගැලපෙන පිළිතුර තෝරන්න.

(i) භූගත කඳ - බතල
(ii) මුල් - කරපිංචා
(iii) බීජ - දොඩම්
(iv) පත්‍ර - කෝමාරිකා

24) ජලය මගින් ප්‍රචාරණය වන බීජයක් හා ජලය මගින් පරාගණය වන පුෂ්පයක් සහිත ශාක පිලිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(i) පොල්, වැලිස්නේරියා
(ii) හයිඩ්‍රිල්ලා, පොල්
(iii) දියකඳුරු, පුවක්
(iv) පොල්, නෙළුම්

25) අසම්පූර්ණව බෙදුනු කෝෂිකාවක් සහිත සත්ව කාණ්ඩයෙහි සමෙහි ස්වභාවය මින් කුමක්ද?

(i) ග්‍රන්ථි සහිතයි (iii) කොරල සහිත වියලි සමකි

(ii) තුනී තෙත් සමකි (iv) පිහාටු වලින් ආවරණය වී ඇත

26) මෙම අණු අතරින් වැඩිම පරමාණු ගණනක් පවතින සංයෝගය කුමක්ද?

(i) $CH_3COOH$ (iii) $CO(NH_2)_2$

(ii) $Al_2(CO_3)_3$ (iv) $HNO_3$

27) සමාන සාපේක්ෂ අණුක ස්කන්ධයන් සහිත අණු යුගල තෝරන්න.

**N - 14, C - 12, O - 16, H - 1**

(i) $N_2$ හා $CO$ (iii) $NO$ හා $O_2$

(ii) $CH_4$ හා $N_2$ (iv) $N_2$ හා $H_2$

28) ඌනතා ලක්ෂණයට හේතුවන විටමිනය නිවැරදිව දක්වා ඇති පිලිතුර තෝරන්න.

(i) අස්ථි විකෘති වීම - විටමින් $E$ (iii) ස්කර්වි රෝගය - විටමින් $B$

(ii) නිශා අන්ධතාව - විටමින් $A$ (iv) රිකට්සියාව - විටමින් $C$

29) ඔක්සයිඩයේ ජලීය ද්‍රාවණය නිල් ලිට්මස් රතු පැහැයට හරවන්නේ මින් කුමන සංයෝගයද?

(i) මැග්නීසියම් ඔක්සයිඩ් (iii) සෝඩියම් ඔක්සයිඩ්

(ii) සල්ෆර්ඩයොක්සයිඩ් (iv) කැල්සියම්ඔක්සයිඩ්

30) ඝර්ෂණ බලය වැඩිකර ගැනීමට යොදන උපක්‍රමයක් නොවන්නේ,

(i) වාහන ටයර් වල කට්ටා කැපීම

(ii) බයිසිකල් පැඩලයට රබර් ආවරණ යෙදීම

(iii) සපත්තු අඩියෙහි කට්ටා කැපීම

(iv) බර වාහන වල පිටුපස ටයර් යුගල බැගින් යෙදීම

31) මල බද්ධය වලක්වා ගැනීමට ආහාරයට වැඩිපුර එකතු කරගත යුතු වන්නේ,

(i) ග්ලූකෝස් (ii) පිෂ්ටය (iii) ප්‍රෝටීන (iv) සෙලියුලෝස්

32) $C_6H_{12}O_6$ අණු මවුල $\frac{1}{4}$ ක් තුල අඩංගු ඔක්සිජන් පරමාණු ගණන කොපමණද?

(i) $\frac{6.022\times10^{23}}{4}$ (ii) $\frac{6.022\times10^{23}\times6}{4}$ (iii) $\frac{6.022\times10^{23}\times2}{3}$ (iv) $\frac{6.022\times10^{23}}{6}$

33) පොල් ගසෙහි විද්‍යාත්මක නාමය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(i) $Cocos\ Nucifera$ (iii) $cocos\ NUCIFERA$

(ii) $cocos\ nucifera$ (iv) $Cocos\ nucifera$

34) මේවායින් දිලීර භාවිතා කරනු ලබන කර්මාන්ත මොනවාද?

$A -$ ප්‍රතිජීවක නිෂ්පාදනය

$B -$ යෝගට් නිෂ්පාදනය

$C -$ විනාකිරි නිෂ්පාදනය

(i) $A$ පමණි (iii) $A$ හා $C$ පමණි

(ii) $B$ පමණි (iv) $A$ හා $B$ පමණි

35) වස්තුවක් චලනය වන විට ඝර්ෂණ බලය ක්‍රියාත්මක වන්නේ,

(i) වස්තුවේ චලිත දිශාවටය (iii) වස්තුවේ චලිත දිශාවට ප්‍රතිවිරුද්ධවය

(ii) ගුරුත්වය දෙසටය (iv) ගුරුත්වයට ප්‍රතිවිරුද්ධවය

36) ලී කුට්ටියක ස්කන්ධය $15\ kg$ වේ. එය තිරස් මේසයක් මත තබා ඇත. මේස ලෑල්ල මගින් ලී කුට්ටිය මත යෙදෙන බලය කොපමණද?

(i) $100\ N$ (ii) $150\ N$ (iii) $15\ N$ (iv) $10\ N$

37) නිව්ටන්ගේ තුන්වන නියමය ආදර්ශනය කිරීමට සුදුසු මින් කුමන පිළිතුරද?

(i) පොල්ගසකින් ගෙඩියක් වැටීම
(ii) මෝටර් රථයක් ඒකාකාර වේගයෙන් සරල රේඛීය මගක ගමන් කිරීම
(iii) වාතය පිරවූ බැලූනයක කට විවෘත කර අත හැරිය විට එය වේගයෙන් වාතය තුල ගමන් කිරීම
(iv) ඉහලට විසිකල ගල් කැටයක ප්‍රවේගය ක්‍රමයෙන් අඩුවීම

38) $8\ ms^{-1}$ ඒකාකාර ප්‍රවේගයකින් චලනය වෙමින් පැවතුන වස්තුවක ප්‍රවේගය $10s$ කදී $18\ ms^{-1}$ දක්වා වැඩි විය. වස්තුවේ ස්කන්ධය $10\ kg$ නම් එය මත යෙදුනු බාහිර අසමතුලිත බලය වන්නේ,

(i) $2.8\ N$ (ii) $10\ N$ (iii) $20\ N$ (iv) $80\ N$

39) විද්‍යාත්මක ක්‍රමවේදයට අනුව කසල බැහැර කිරීමේ ස්ථානයක් ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ස්ථානය කුමක්ද?

(i) මුතුරාජවෙල
(ii) පෑලියගොඩ
(iii) අරුවක්කාලු
(iv) මීතොටමුල්ල

40) මේ දිනවල සීඝ්‍ර ව්‍යාප්තියක් සහිත චිකන්ගුන්යා රෝගයට හේතු වන රෝග කාරකය

(i) වෛරසයකි
(ii) බැක්ටීරියාවකි
(iii) ප්‍රෝටසෝවාවෙකි
(iv) දිලීරයකි